00221

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ
ඩිප්ලෝමා වැඩසටහන - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

ESD 1135 – පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික ඉගැන්වීම සඳහා සමෝධානිත ප්‍රවේශය

කාලය - පැය 02යි.

---

දිනය - 2013.12.22 වේලාව - ප.ව. 02.00 - ප.ව.04.00

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද, දෙවන කොටසේ ප්‍රශ්න තුනකටද (03) පමණක් පිළිතුරු සපයන්න.

**I - කොටස**

01. "සමෝධානිත ප්‍රවේශය" යන සංකල්පය නිර්වචනය කරන්න.

02. සමෝධානිත ප්‍රවේශය මගින් ළමයාගේ සමස්ත සංවර්ධනය පහසු කරන අන්දම පැහැදිලි කරන්න.

03. සමෝධානිත ප්‍රවේශය යටතේ ඉගැන්වීම සඳහා තේමාවක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගතයුතු කරුණු තුනක් (3) කාට් (katz) සහ චාඩ් (Chard) ගේ අදහස් ඇසුරින් ලියන්න.

04. 1975 සමෝධානිත ප්‍රවේශයට අදාල ගුරු අත්පොතෙන්, 1985 ගුරු අත්පොත වෙනස් වන අයුරු කෙටියෙන් පැහැදිළි කරන්න.

05. ශ්‍රී ලංකාවේ 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ක්‍රියාත්මක කළ විෂයමාලාවට අයත් විෂයයන් නම් කරන්න.

06. ගුරු අත්පොතෙහි යෝජනා කර ඇති පරිදි, "සෙල්ලම් කඩය" තේමාව යටතේ 1 ශ්‍රේණියේ ළමයින් තුළට දීමට බලාපොරොත්තු වන ප්‍රධාන හැකියාවන් තුනක් (03) ලියන්න.

07. සමෝධානිත ප්‍රවේශයට අදාල ඇගයීම් ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ප්‍රාථමික ගුරුවරයෙකුට කාර්ය සාධක ගොනුවේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - කොටස

09. තුන්වන ශ්‍රේණියේ ළමයින් කණ්ඩායමක් සමඟ කැළණියේ පිහිටි "වෝටර් වර්ල්ඩ්" (මසුන් ඇති ස්ථානය) වෙත යාමට ඔබට අවස්ථාවක් ලැබුණා යැයි සිතන්න. නැවත පැමිණීමෙන් පසු ඔබ කැමති තේමාවක් තෝරාගෙන සමෝධානිත ප්‍රවේශය යටතේ පාඩමක සැලැස්මක් එම 3 වන ශ්‍රේණියේ ළමයින් වෙනුවෙන් සකස් කරන්න. (තේමාව, නිපුණතා මට්ටම්, ක්‍රියාකාරකම්, සුදුසු උදාහරණ සමඟ දක්වන්න.)

(ලකුණු 20)

10. (i) 1972 පසුව ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පංති සඳහා සමෝධානිත ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමට හේතු විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) සමෝධානිත ඉගෙනුම් -ඉගැන්වීම් ප්‍රවේශය, සම්ප්‍රදායික ඉගැන්වීම් ප්‍රවේශයන් සමඟ සසඳන්න.

(ලකුණු 10)

11. "සේවාස්ථ ගුරු පුහුණු වැඩ සටහන් ප්‍රාථමික පාසල් ගුරුවරුන්ගේ සංවර්ධනයට පමණක් නොව ප්‍රාථමික සිසුන්ගේ සංවර්ධනයටත් අත්‍යාවශ්‍ය වේ." සේවාස්ථ පුහුණු වැඩසටහනක් ඉහත කාණ්ඩ දෙකේම සංවර්ධනයට බලපාන අයුරු නිදසුන් සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 20)

12. (i) ප්‍රාථමික පාසල් සිසුන් සඳහා ඇගයුම් වාර්තා පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) සිසුන්ගේ වාර්තාවල සඳහන් විය යුතු තොරතුරු මොනවා ද? (ලකුණු 05)

(iii) ප්‍රාථමික පාසල් ගුරුවරයා විසින් සිසුන්ගේ ප්‍රගතිය වාර්තා කළයුතු ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

13. (i) තක්සේරුකරණය යනු කුමක් ද?

(ලකුණු 03)

(ii) ඵලදායී තක්සේරුකරණයක සුවිශේෂ ලක්ෂණ නම් කරන්න.

(ලකුණු 07)

(iii) ප්‍රාථමික පාසල් ළමුන් තක්සේරුකිරීම සඳහා යොදාගත හැකි ශිල්ප ක්‍රම තුනක් (03) නම්කර, ඉන් එකක භාවිතය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2013**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 3**

**ESD1135 – INTEGRATED APPROACH IN PRE-PRIMARY AND PRIMARY TEACHING**

**DURATION – TWO (02) HOURS.**

---

Date: 22nd December 2013 Time: 2.00 p.m.- 4.00 p.m.

---

Answer all questions in Part I and any three from Part II.

## PART I

01. Define the concept "Integrated approach".

02. Explain how integrated approach will facilitate total development of children.

03. Write three (03) facts in relation to Katz and Chard's views, that should be considered when selecting a them for teaching under Integrated approach.

04. Explain in brief how 1985 teachers hand book of integrated approach is different from 1975 Teachers hand book.

05. Name the subjects in the curriculum of the primary education implemented under Educational Reform of 1972, in Sri Lanka.

06. As suggested in the Teachers handbook, write three (03) main abilities expected to develop in Grade one children through the "play shop" theme.

07. Explain in brief, the evaluation process related to integrated approach.

08. Explain in brief the importance of portfolio to a primary teacher.

(5 x 8 = 40 marks)

## PART II

09. Imagine that you have been given an opportunity to visit "water World" (Aquarium) at Kelaniya with a group of grade 03 children. After arrival, select a theme of your choice and prepare a lesson plan for those grade 03 children using the integrated approach. (Indicate the theme, competency level, activities with suitable examples. )

(20 marks)

10. i. Describe the reasons for implementing the integrated teaching learning approach for primary grades; in Sri Lanka after 1972.

(10 marks)

ii. Compare the traditional teaching approaches with the integrated teaching learning approach.

(10 marks)

11. "In service Teacher Training Programmes are essential not only for the development of primary school teachers but also for the development of primary school children"

Discuss with examples how an in-service training programme would affect the development of both parties.

(20 marks)

12. i. Explain the necessity of maintaing evaluation record for primary school children.

(05 marks)

ii. What information should be included in students' reports?

(05 marks)

iii. Describe how should the primary school teacher record students' progress.

(10 marks)

13. i. What is assessment?

(03 marks)

ii. Name the special features of an effective assessment?

(07 marks)

iii. Name three (03) techniques that could be used for assessing primary school children and explain the application of one technique.

(10 marks)

*-Copyrights reserved -*